(ඎ) අබාධිත පිරිස් වෙත ඔවුන්ගේ පෞරුෂත්වය වර්ධනය කර ගැනීම සඳහා සියලු ආකාරයේ ආධාර කිරීම හා පෙර පාසල්/පූර්ව ළමාවිය අධ්‍යාපනයට අදාළ සියලු ආකාරයේ ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(එ) දුරස්ථ සහ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා හඳුනා ගැනීම සහ එවැනි ප්‍රදේශවල සායන සහ සෞඛ්‍ය කඳවුරු මෙහෙයවීම සහ එම සායන සහ සෞඛ්‍ය කඳවුරු මගින් අත්‍යාවශ්‍ය අයට ඖෂධ සැපයීම;

(ඒ) දුම්කොළ, මධ්‍යසාර සහ මත්ද්‍රව්‍යවලින් තොර සමාජයක් ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම සහ එමගින් සෞඛ්‍යසම්පන්න, විනයවත් දේශානුරාගයෙන් සහ මානව දයාවෙන් යුත් පරම්පරාවක් බිහිකිරීම;

(ඔ) දැනට මාතර, මාලිම්බඩ, ජාඇල හා මැද දුම්බර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ආරම්භ කර ක්‍රියාත්මක කරන මධ්‍යස්ථානයන්ට අමතරව ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක මධ්‍යස්ථාන ආරම්භකර පවත්වාගෙන යාම;

(ඕ) ගොවීන් හා ධීවරයන් දිරිගැන්වීම සහ තරුණ ගොවි හා ධීවර සංවිධාන ඇති කිරීම;

(ක) පොදුජන සුභසාධනයට සහ හදිසි ආපදා, ජාතික ව්‍යසනයන්හි දී තරුණ හා වැඩිහිටි ශ්‍රමය යොමු කිරීම;

(ග) ශ්‍රී ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම් සහ බර්ගර් ජනතාව අතර සාමය හා එකමුතුකම ගොඩනැගීම සඳහා පුද්ගලයන් අතර අන්‍යෝන්‍ය අවබෝධය ද, ජාතික සවිඥනකත්වය පිළිබඳ හැඟීම වර්ධනය කිරීම පිණිස ද, හොඳහිත සහ මිත්‍රත්වය අභිවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ච) ආගමික, සංස්කෘතික, සමාජයීය හා ආර්ථික අන්තර් ක්‍රියාකාරිත්ව තුළින් ශ්‍රී ලාංකීය ජනතාව තුළ ආගමික සුසංගමය, අන්‍යෝන්‍ය අවබෝධය, සාමකාමී සහජීවනය, අධ්‍යාත්මික සංවර්ධනය සහ මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම;

